# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනය (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා විසින්
2013 නොවැම්බර් මස 29 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 ඔක්තෝබර් මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[277 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි          තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනය (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

වෙනත් දේ අතර, ශ්‍රී ලංකාවේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කර්මාන්තය පිළිබඳ කවර හෝ සංස්ථාගත කළ හෝ නොකළ බලයලත් මණ්ඩලයක අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ පෝෂණය කිරීමේ හා ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව සහ ස්ථාවර වූ ද යහපත් වූ ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයක් සම්බන්ධයෙන් සහායවීම පිණිස ද, එකී සම්මේලනයට සම්බන්ධ සියලු කාරණා පවත්වාගෙන යෑම සහ කටයුතු කරගෙන යෑම පිණිස ද "ශ්‍රී ලංකා තොරතුරු කර්මාන්ත සම්මේලනය" නමැති සහ හඳුන්වනු ලබන ලාභ නොලබන සංවිධානයක් පිහිටුවනු ලැබ ඇති හෙයින් :

1996 වර්ෂයේ දී එකී සම්මේලනය පිහිටුවූයේ කවර අරමුණු සහ කාරණා සඳහා ද, එකී සම්මේලය මීට පෙර නොයෙක් අරමුණු සහ කාරණා පවත්වාගෙන යනු ලබන ඇති සහ කටයුතු කරගෙන යනු ලැබ ඇති හෙයින් හා එය සංස්ථාගත කිරීමට අපේක්ෂා කරන හෙයින් ද, නීතියෙන් එවැනි සංස්ථාගත කිරීමක් සඳහා ඉඩකඩ ලබාදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

එම නිසා එකී සම්මේලනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පහත සඳහන් පරිදි පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2013 අංක  දරන තොරතුරු තාක්ෂණ කර්මාන්ත (සංස්ථාගත කිරීමේ) සම්මේලනය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනය සංස්ථාගත කිරීම.

**2.** මෙම පනත ක්‍රියාත්මකවීම පටන් ගන්නා දිනයේ සිට සහ පසුව ( මෙහි පහත "සම්මේලනය" හෝ "ෆිට්ස්" යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනයේ දැනට සිටින සාමාජිකයින් වශයෙන් හෝ මෙම පනත මගින් ස්ථාපනය වූ ෆිට්ස් සම්මෙලනයේ සාමාජිකයින් වශයෙන් ඇතුල් වන්නා වූ එවැනි සාමාජික පුද්ගල සමූහය "ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනය" යන නාමය සහ විලාශය යටතේ අවිච්ඡින්න අනුප්‍රාප්තිය සහිතය. ( මෙහි පහත "සංස්ථාව" වශයෙන් හඳුන්වනු ලබන) සංස්ථා මණ්ඩලයක් විය යුතු අතර, පොදු මුද්‍රාවක්

ඇතිව සිටීමට සහ පාවිච්චි කිරීමට සහ සංස්ථාවේ කැමැත්ත ඇතිව එය වෙනස් කිරීමට පූර්ණ ශක්තිය සහ බලය ඇතිව නඩු දැමීමට සහ දමනු ලැබීමට හැකි විය යුතු ය.

සංස්ථාවේ අරමුණු.

**3.** සංස්ථාව සංස්ථාපනය කරන්නේ කුමන අරමුණු සඳහා ද එම අරමුණු මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ :—

(අ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කර්මාන්තය පිළිබඳ කවර හෝ සංස්ථා මණ්ඩලයක් (එවැනි මණ්ඩලයක් සංස්ථාගත කර තිබුණත් හෝ නැතත්) එහි අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, දිරිගැන්වීම, සංවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම ;

(ආ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයට සම්බන්ධ සංස්ථා මණ්ඩලය සඳහා උපදෙස් දෙනු ලබන විමසා බලනු ලබන සහ සම්බන්ධීකරණය කරනු ලබන මණ්ඩලයක් වශයෙන් කටයුතු කිරීම ;

(ඇ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කර්මාන්තය සම්බන්ධ සංස්ථා මණ්ඩලය (එවැනි මණ්ඩලයක් සංස්ථාගත කර තිබුණත් හෝ නැතත්) ශ්‍රී ලංකා රජය සමග සංගමයේ සියලු සාකච්ඡාවලදී කර්මාන්තයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සහ නියෝජනය කිරීම;

(ඈ) අදහස්, දැණුම සහ පළපුරුද්ද හුවමාරු කරගැනීම පහසු කිරීමේ අදහසක් ඇතිව සමාන අරමුණු ඇති වෙනත් සංස්ථා මණ්ඩල සමග ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම ;

(ඉ) කර්මාන්තය විසින් පිළිපැදිය යුතු චර්යාව පිළබඳ සංග්‍රහ විධිමත්ව සකස් කිරීම, පවත්වාගෙන යෑම සහ ප්‍රකාශයට පත්කිරීම ද, මහජනතාවගේ විශ්වාසය සහ ගරුත්වය දියුණු කිරීම පිණිස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ සෑමතැනම චර්යාව, සේවය සහ කාර්යසාධනය පිළිබඳ උසස් ප්‍රමිතියක් ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම ;

(ඊ) වැඩ සහ සංස්ථාවේ සාමාජිකයන් සඳහා චර්යාව පිළිබඳ සදාචාරමය සහ වෘත්තීමය ප්‍රමිතීන් දිරිගැන්වීම සහ පෝෂණය කිරීමට ද, ඒවා ප්‍රවර්ධනය කිරීමට ද අවශ්‍ය වන පරිදි යම් යම් පියවර ගැනීම.

(උ) තොරතුරු සහ සන්නිවේදන කර්මාන්තයේ ඵල ප්‍රයෝජනය සහ දියුණුව සඳහා ක්‍රම සහ විධිවේද සම්බන්ධයෙන් තොරතුරු සහ අදහස් එකතු කිරීම, විශ්ලේෂණය කර බැලීම සහ බෙදාහැරීම ;

(ඌ) ෆිට්ස් ආයතනයේ සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරිමේ අදහසක් ඇතිව රජය හෝ කවර මහජන ආයතන සමග අන්‍යෝන්‍යව ක්‍රියා කිරීම ;

(එ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම පිණිස විධායක කවුන්සලය නිගමනය කරනු ලැබීමට ඉඩ ඇති පරිදි එවැනි වෙනත් ක්‍රියාකාරකම්වල යෙදීම ;

(ඒ) ඉහත අරමුණු සපුරා ගැනීම පිණිස ආනුසංගික හෝ පාදක වන පරිදි සියලු වෙනත් ක්‍රියාවන් සහ කාරණා ආදිය කිරීම.

සංස්ථාවේ බලතල.

**4.** (1) මේ පනතේ විධිවිධානවලට සහ කවර හෝ වෙනත් ලිඛිත නීතියකට යටත්ව, සංස්ථාවේ අරමුණු හෝ ඒවායින් කවර හෝ එකක් ප්‍රවර්ධනය කිරීම හෝ වැඩිදියුණු කිරීම පිණිස අවශ්‍ය වන හෝ පාදක වන හෝ ආනුසංගික වන කොයිකවර එවැනි සියලු ක්‍රියාවන්, කරුණු සහ කාරණා ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලතල තිබෙන්නේ ය.

(2) ඉහත (1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල පිළිබඳ පොදුකමට අගති රහිතව සංස්ථාවට පහත සඳහන් බලතල සහ කාර්යයන් භාවිතා කළ හැකිය සහ ඉටුකළ හැකි ය :—

(අ) කවර හෝ මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් හිමිකර දීමක් හෝ වෙනත් ආකාරයක් අනුව සංස්ථාවට හිමිවීමට හැකි කවර හෝ චංචල හෝ නිශ්චල දේපලක් අත්පත් කර ගැනීමට, අයිතිව සිටීම සහ සංවර්ධනය කිරීම;

(ආ) කවර හෝ එවැනි දේපලක් හෝ එවැනි දේපලක පංගුවක් හෝ කොටසක් විකිණීම, උකස් කිරීම, බදුදීම හෝ ප්‍රදානය කිරීම, අන්තිම කැමති පත්‍රයකින් හිමිකර දීම, පවරා දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයෙන් සුදුස්සක් කිරීම;

(ඇ) විධායක කවුන්සලය නිගමනය කරනු ලැබිය හැකි පරිදි සංස්ථාවට අයිති මුදල් යම් යම් ව්‍යාපාර වස්තුව ආයෝජනය කිරීම;

(ඈ) බැංකු ගිණුම් විවෘත කිරීම, මෙහෙයුම් කටයුතු කිරීම සහ වසා දැමීම, සංස්ථාවේ අරමුණු සඳහා ඇප වශයෙන් දේපල තබමින් හෝ එවැනි ඇප නැතිව, මුදල් ණයට ගැනීම, ලබාගැනීම ;

(ඉ) දේශීය වශයෙන් සහ ජාත්‍යන්තරව මුදල් ලබා ගැනීම හා ප්‍රදාන, පරිත්‍යාග හෝ මුදල්වලින් හෝ භාණ්ඩවලින් ලබාගැනීම ;

(ඊ) සංස්ථාවට උපරිම යහපත ඇති වන පරිදි, ඔබින ආකාරයට කවර හෝ අතිරික්ත මුදල් ආයෝජනය කිරීම ;

(උ) විධායක කවුන්සලය සුදුසු යැයි සිතන උපදේශක මණ්ඩයක් පිහිටුවීම ;

(ඌ) සංස්ථාවේ අරමුණු සඳහා අවශ්‍ය විය හැකි පරිදි යම් යම් නිලධාරීන් සහ සේවකයින් පත්කිරීම සහ එවැනි නිලධාරීන් සහ සේවකයින් සේවයෙන් පහකිරීම සහ එවැනි නිලධාරීන්ට සහ සේවකයින්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම ;

(එ) වෙනත් සංවිධාන, ස්වේච්ඡා ආයතන සහ ව්‍යවස්ථාපිත අධිකාරි මණ්ඩල සමග සහයෝගීතාවයෙන් කටයුතු කිරීම හා තොරතුරු හුවමාරු කරගැනීම සහ උපදෙස් ලබාගැනීම ;

**5.** (1) සංස්ථාවේ කටයුතු, මෙම පනතේ විධිවිධානයන්ට යටත් ව කළමනාකරණය නිලතල දරන්නන්ගෙන් සහ 06 වැනි වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති අනුව තෝරා ගනු ලැබිය හැකි පරිදි යම් වෙනත් සාමාජිකයින්ගෙන් සමන්විත (මෙහි පහත කවුන්සලය වශයෙන් හඳුන්වනු ලබන) විධායක කවුන්සලයකින් පරිපාලනය කරනු ලබන්නේ ය. සංස්ථාවේ කටයුතු

(2) මෙම පනත ආරම්භ වන දිනට ආසන්නතම කළින් දිනයේ තනතුරු දරන විධායක කවුන්සලය පළමු කවුන්සලය වන්නේ ය.

**සංස්ථාවේ රීති.**

**6.** (1) පහත සඳහන් සියලු හෝ කවර හෝ කාරණා සඳහා සියල්ලන්ගෙන් කවර හෝ කලින් කලට කවර හෝ රැස්වීමක දී සහ පැමිණ සිටින සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු වැඩි සංඛ්‍යාවකින් සහ ඡන්දය පාවිච්චි කරමින්, සංස්ථාව මෙම පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට ප්‍රතිවිරුද්ධ නොවන රීති සෑදීම නීතිසහගත වන්නේ ය.

(අ) සමාජිකයන් වර්ගීකරණය කිරීම සහ ඇතුළත් කර ගැනීම, සමාජිකයින්ගේ සාමාජිකත්වය අවලංගු කිරීම හෝ ඉල්ලා අස්වීම ඉවත්කර ගැනීම;

(ආ) සාමාජිකයින් පත්කිරීම, ඉල්ලා අස්වීම, ධුරය අත්හැර යෑම හෝ ඉවත් කිරීම, සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ රාජකාරි ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධාරීන්, නියෝජිතයින්ගේ සහ සේවකයින්ගේ බලතල, චර්යාව, රාජකාරි සහ කාර්යයන් ;

(ඈ) කමිටු රැස්වීමේ දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් කැඳවීම් සහ පැවැත්වීම, එම රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන, රැස්වීම් පිළිබඳ දැනුම් දීම් සහ න්‍යාය පත්‍රය, ඒ සඳහා වන සනපූරණය සහ රැස්වීම්වල දී කටයුතු පවත්වාගෙන යෑම ;

(ඉ) සංස්ථාවේ දේපල සම්බන්ධ පරිපාලන සහ කළමනාකරණය එහි මුදල්වල භාරකාරත්වය, සහ සංස්ථාවේ ගිණුම් නඩත්තුව සහ විගණනය;

(ඊ) උපදේශක මණ්ඩලය පත්කිරීම සහ උපදේශක මණ්ඩලයෙන් උපදෙස් ලබා ගැනීමේ ආකාරය යන කාර්යය පටිපාටිය.

(2) සංස්ථාව විසින් සාදන ලද කවර හෝ රීතිවලට, ඒ හා සමාන රැස්වීමක දී සහ (1) උපවගන්තිය යටතේ සෑදූ රීතියක් පරිදි ඒ සමාන ආකාරයට සංශෝධනය කිරීම්, වෙනස් කිරීම්, ඒවාට එකතු කිරීම් හෝ අවලංගු කිරීම් කළ හැකි ය.

(3) විධායක කවුන්සලයේ සාමාජිකයන් සියලු කාලවලදී සංස්ථාවේ රීතිවලට යටත් වන්නේ ය.

සංස්ථාවේ අරමුදල්.

**7.** සංස්ථාවේ අරමුදල් පහත සඳහන් පරිදි සමන්විත වන්නේ ය:—

(අ) මෙම පනත ආරම්භ වන දිනට ආසන්නම කලින් දිනයේ ෆිට්ස් ආයතනයට බැරට තිබෙන සියලු මුදල්, එම දිනයේ සිට සංස්ථාවට මාරුවී පවතින්නේ ය;

(ආ) මෙම පනත ආරම්භ වන දිනට පසුව ආයෝජනවලින් වෙනත් ලැබීම්වලින් ෆිට්ස් ආයතනයට ලැබිය යුතු සියලු මුදල් සංස්ථාවට එකතු විය හැකි ය;

(ඇ) සංස්ථාවේ ඉලක්ක සහ අරමුණු පවත්වාගෙන යාමේ අරමුණු වෙනුවෙන් කලින් කලට රජයෙන් ලැබෙන කවර හෝ ප්‍රදාන.

අරමුදලින් කරන ගෙවීම්.

**8.** (1) අරමුදලින් පහත සඳහන් ගෙවීම් කළ යුත්තේ ය :—

(අ) සංස්ථාවේ වැඩ කටයුතු කිරීම, නඩත්තු කටයුතු කිරීම වෙනුවෙන් අවශ්‍ය වියහියදම් ;

(ආ) නිලධාරින්ට. සේවකයින්ට සහ වෙනත් සේවකයින්ට වැටුප් සහ දිරිගැන්වීමේ දීමනා ගෙවීම.

(ඇ) සංස්ථාවේ අරමුණු පවත්වාගෙන යෑමේ අරමුණ සඳහා අවශ්‍ය වන පරිදි විධායක කමිටුව විසින් අනුමත කරන පරිදි සියලු එවැනි වෙනත් ගෙවීම්.

(2) කෙසේවුවත්, උපයාගත් සංස්ථාවට අයිති මුදල් සහ දේපල හුදෙක්ම, ඉහත විශේෂයෙන් සඳහන් කර ඇති අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා යොදාගත යුත්තේ ය. තව ද, මුදල්වල සහ දේපලවල කවර හෝ කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභ, පාරිතෝෂික දීමනා හෝ අන්‍යාකාරයෙන්, කොයිකවර වශයෙන්වත් කෙළින් හෝ වක්‍රව නොගෙවිය යුත්තේ ය.

උපදේශක මණ්ඩලය.

**9.** (1) විධායක කවුන්සලය විසින් උපදේශක මණ්ඩලයක් පත්කර ගත යුතු ය.

(2) සමිති ආඥා පනතේ (123 වැනි පරිච්ඡේදය) යටතේ ලියාපදිංචි කර ඇති සමිතියක් වන ඉන්ෆොටෙල් ලංකා සොසයිටි ලිමිටඩ් සමිතියේ කවුන්සලයේ සාමාජිකයන් උපදේශක මණ්ඩලයේ සේවය කිරීමේ හැකියාවක් පවතී.

සංස්ථාවෙන් ලැබිය සහ සංස්ථාවට ගෙවීමට ඇති ණය.

**10.** මෙම පනත ආරම්භ වන දිනට පෙර ආසන්නතම දිනයේ පැවතිය යුතු ෆිට්ස් ආයතනයේ ණය සහ බැරකම් මෙම පනතින් සංස්ථාපන කළ සංස්ථාවට ගෙවා නිදහස් කරනු ලබන්නේය. තවද, එදිනට ෆිට්ස් ආයතනයට ලැබිය යුතු සියලු ණය සහ ගෙවීමට ඇති සාමාජික මුදල් සහ දායකත්ව මුදල් මෙම පනතේ අරමුණු සඳහා සංස්ථාවට ගෙවිය යුත්තේ ය.

ෆිට්ස් ආයතනයේ කොන්ත්‍රාත් යානාදිය සංස්ථාවේ ඒවා වශයෙන් සැලකිය යුතු ය.

**11.** මෙම පනත ක්‍රියාත්මක වීමට පෙර ආසන්නතම දිනයේ පවතින එකී ෆිට්ස් ආයතනයට සම්බන්ධ සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම් මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි මෙම පනතින් සංස්ථාපනය කළ සංස්ථාවේ කොන්ත්‍රාත් සහ ගිවිසුම් වශයෙන් සැලකිය යුත්තේ ය.

ගිණුම් සහ විගණන.

**12.** (1) සංස්ථාව වර්ෂයකට එක් වතාවක්වත් එහි ගිණුම් පොත්වල ගණන් හිලවු බැලීමට හා විගණනයට සැලැස්විය යුතු ය. ආදායම් හා වියදම් ගිණුමද ශේෂ පත්‍රය ද අත්සන් කිරීම පිණිස සංස්ථාව විසින් සම්මත කරගන්නා ලද යෝජනාවක් මගින් බලය පවරන ලද සංස්ථාවේ සාමාජිකයන් දෙදෙනකු විසින් ඒවායේ නිවැරදිතාවය අත්සන් මගින් සහතික කළ යුතු අතර, සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණනවරයෙකු විසින් විගණනය කළ යුත්තේ ය.

(2) සංස්ථාව ආදායම් සහ වියදම් ගිණුම ද වත්කම් හා බැරකම් සහ අනෙකුත් ගණුදෙනු වල ගිණුම් නිසි ආකාරයෙන් පවත්වාගෙන යා යුතු ය.

(3) මෙම (1) වන වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නේ අර්ථය :—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ නීතියෙන් පිහිට වූ යම් වෙනත් ආයතනයක එම ආයතනවල කවුන්සලය විසින් ගණකාධිකාරිවරයකු වශයෙන් ගිණුම් වෘත්තියේ යෙදීම පිණිස සහතිකයක් තිබෙන ;

(ii) එක් එක් නේවාසික හවුල්කරුවන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හෝ නීතියෙන් පිහිට වූ යම් වෙනත් ආයතනයක, එම ආයතනවල සහතිකයේ තිබෙන සාමාජිකයෙකු වන ගණකාධිකාරී හවුල් සමාගමක්.

සංස්ථාවේ මුල්‍ය අවුරුද්ද.

**13.** සංස්ථාවේ මුල්‍ය වර්ෂය ලිත් අවුරුද්දක් විය යුත්තේ ය.

මෙම පනත යටතේ නඩුවලදී විධායක කමිටුවේ සාමාජිකයන් සහ නිලධාරීන් යනාදීන් ආරක්ෂා කිරීම.

**14.** (1) කවර හෝ අධිකරණයක් ඉදිරියේ ෆිට්ස් ආයතනය විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබ ඇති කවර හෝ නඩුවක් හෝ පැමිණිල්ලක් සම්බන්ධයෙන් ෆිට්ස් ආයතනය විසින් දරන ලද කවර හෝ වියදම් සංස්ථාවේ මුදල්වලින් ගෙවිය යුත්තේ ය. තව ද එවැනි යම් නඩුවක් හෝ පැමිණිල්ලක් සම්බන්ධයෙන් ෆිට්ස් ආයතනයට ගෙවූ කවර හෝ නඩු ගාස්තු හෝ එම ආයතනය විසින් අයකර ගනු ලැබූ සංස්ථාවේ අරමුදලට බැර කළ යුත්තේ ය.

(2) මෙම පනත යටතේ හෝ විධායක කවුන්සලය නියමය මත කර ඇති හෝ එසේ කර ඇති බවට අරමුණු කරන කවර හෝ ක්‍රියාවක් සම්බන්ධයෙන් කවර හෝ අධිකරණයක් ඉදිරියේ ෆිට්ස් ආයතනයට විරුද්ධව පවරනු ලැබ ඇති කවර හෝ නඩුවක් හෝ පැමිණිල්ලක් සම්බන්ධයෙන් සද්භාවයෙන් එම ක්‍රියාව කරනු ලැබුයේ යැයි අධිකරණය තීරණය කරයි නම් ඉහත (1) උප වගන්තියේ සඳහන් කර ඇති පරිදි ෆිට්ස් ආයතනය විසින් දරනු ලබූ කවර හෝ වියහියදම්, එම නඩුව හෝ පැමිණිල්ල සම්බන්ධයෙන් ෆිට්ස් ආයතනය විසින් එම වියදම් අයකර ගනු ලැබුවොත් මිස සංස්ථාවේ මුදල්වලින් ගෙවිය යුතුය.

සංස්ථාවේ මුද්‍රාව.

**15.** සංස්ථාවේ මුද්‍රාව එහි සභාපතිගේ භාරයේ තිබිය යුතු අතර, විධායක කවුන්ලය විසින් නිගමනය කළ හැකි පරිදි යම් ආකරයකින් වෙනස් කළ හැකි ය. විධායක කමිටුවේ අනුමැතිය නැතිව, කොයි කවර හෝ සාධන පත්‍රයකට මුද්‍රාව නොතැබිය යුත්තේ ය.

තවද එවැනි සාධන පත්‍රයක් සාක්ෂි වශයෙන් කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරියේ අත්සන් කළ යුත්තේ ය. එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවෙකු වශයෙන් කවර හෝ පුද්ගලයෙකු අත්සන් කිරීමට වෙන්ව විය යුත්තේ ය.

සංස්ථාවට චංචල සහ නිශ්චල දේපල අයිතිව සිටිය හැකි ය.

**16.** කවර හෝ මිලට ගැනීමක්, ප්‍රධානයක්, ත්‍යාගයක්, මුදල් පැවරීමක් අනුව හෝ අන්‍යාකාරයෙන් අයිතියට පත්විය හැකි, කවර හෝ චංචල හෝ නිශ්චල දෙපලක් අත්පත් කර ගැනීමට සහ අයිතිව සිටීමට සංස්ථාවට නීතියෙන් හැකියාව සහ සුදුසුකම ඇත්තේ ය. තව ද, එවැනි සියලු දේපල මෙම පනතේ අරමුණ සඳහා ද දේපල විකිණීම, උකස් කිරීම, බදු දීම, මාරු කිරීම හෝ අන්‍යාකාරයෙන් සුදුස්සක් කර අවසන් කිරීම පිණිස සංස්ථාවේ තත්කාලයේ වලංගුව තිබෙන රීතිවලට යටත්ව ද, සංස්ථාව විසින් එවැනි සියලු දේපල අයිතිව සිටිය යුත්තේ ය.

සංස්ථාවේ යම් පුද්ගලයකුට හෝ දේපලකට විරුද්ධව සහ විධායක කමිටුවේ කවර හෝ නිලධාරියකුට හෝ සාමාජිකයකුට විරුද්ධව රීති බලයක් නිකුත් නොකල යුත්තේ ය.

**17.** සංස්ථාවට විරුද්ධව පවරනු ලැබූ කවර හෝ නඩුවක් සම්බන්ධයෙන් සංස්ථාවේ යම් පුද්ගලයකුට හෝ දේපලකට විරුද්ධව සහ විධායක කමිටුවේ කවර හෝ සාමාජිකයෙකුට හෝ සංස්ථාවේ කවර හෝ නිලධාරියෙකුට, සේවකයෙකුට හෝ නියෝජිතයෙකුට විරුද්ධව රිට් බලයක් නිකුත් නොකළ යුත්තේ ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.